# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1996/52 - 2016 දෙසැම්බර් මස 09 වැනි සිකුරාදා - 2016.12.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**සුරාබදු ආඥා පනත**

අංක 991 දරන සුරාබදු නිවේදනය

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි සුරාබදු ආඥාපනතේ (52 වන අධිකාරය වූ) 32 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් අමාත්‍ය, රවි කරුණානායක වන මම, මෙම නිවේදනය මගින් අංක 1232/12 දරන 2002 අප්‍රේල් 18 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ අංක 844 දරන සුරාබදු නිවේදනයේ 26, 27 සහ 39 යන වගන්ති 2017.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් ලෙස සංශෝධනය කරමි.

රවි කරුණානායක,
මුදල් අමාත්‍ය.

2016 දෙසැම්බර් මස 09 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

**ස්කාගාර/ගුදම් පාලනය වන නියෝග**

අංක 1232/12 දරන 2002 අප්‍රේල් 18 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ අංක 844 දරන සුරාබදු නිවේදනය මෙමගින් පහත දැක්වෙන පරිදි සංශෝධනය කෙරේ :-

1. 26 වැනි වගන්තිය සම්පූර්ණයෙන් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කිරීමෙන් ;

''26. ස්කාගාරකරුවන්/ගුදම් ක්‍රියාකරුවන්/බෝතල්ගත කිරීමේ යන්ත්‍රාගාර ක්‍රියාකරුවන් තොග ඌණතා සඳහා ගණන් පෙන්විය යුතු බව - සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි කාල පරාසයන්ට අනුව හෝ ඕනෑම අවස්ථාවක දී හෝ ස්කාගාරකරුවන්/ගුදම් ක්‍රියාකරුවන්/බෝතල්ගත කිරීමේ යන්ත්‍රාගාර ක්‍රියාකරුවන් ලඟ තිබෙන භෞතික තොගවල ගණනයක් කරනු ලැබේ. අපතය වෙනුවෙන් ලිත් වර්ෂයකට ඕනෑම අවස්ථාවක එම භෞතික තොගයෙන් 0.1% නොඉක්මවන ඌණතාවයකට අවසර දිය හැක. නමුත් එම සහනදානය ඉක්මවා යන්නා වූ ද ඊට සතුටුදායක පැහැදිලි කිරීමක් නොලැබෙන්නා වූ ද, සුරාබදු කොමසාරිස් ජනරාල් සෑහීමට පත්වන්නා වූ ආකාරයට ගණන් පෙන්වීමට ස්කාගාරකරු/ගුදම් ක්‍රියාකරු/බෝතල්ගත කිරීමේ යන්ත්‍රාගාර ක්‍රියාකරු අපොහොසත් වන්නා වූ ද සියළුම ස්ප්‍රීතු ප්‍රමාණයන් වෙනුවෙන් තත් අවස්ථාවේ දී බලපවත්නා බදු අනුපාතිකයන්ට අනුව රජයට බදු ගෙවිය යුතු වේ. පහත සඳහන් පරිදි අතිරික්තය මත බදු අයකිරීමේ කාර්යාර්ථයන් සඳහා අපතය ගණනය කළ යුත්තේ පරීක්ෂණය පවත්වන්නට යෙදුනු දිනය අනුව අනුපාතික පදනමිනි.''



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. 27 වැනි වගන්තිය සම්පූර්ණයෙන් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කිරීමෙන් :-

''27. නොවැළැක්විය හැකි හේතුවක් මත බද්දෙන් නිදහස් කිරීම - එකී 0.1% ඌණතා සීමාව ඉක්මවා ගොස් ඇත්තේ නොවැළැක්විය හැකි හේතුවක් කරණ කොට ගෙන බව සුරාබදු කොමසාරිස් ජනරාල් හෝ ඔහු විසින් පත් කෙරුණ එවැනි නිලධාරියෙකු සෑහීමට පත්වන අයුරින් ඔප්පු කරනු ලැබුවහොත්, එවැනි ඌණතාවයක් මත ඉහත කී අනුපාතිකය මත බදු අයකිරීම අතහැර දැමීමට සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ නිර්දේශ මත භාණ්ඩාගාර ලේකම්ට හැකිය. මෙය අදාළ වන්නේ වෙනත් අයුරිකින් හානි පූරණයක් සිදු නොවන අවස්ථාවක දී පමණි.''

3. 39 වැනි වගන්තිය සම්පූර්ණයෙන් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කිරීමෙන් ;

''39. ප්‍රවාහනයේදී ඇතිවන කාන්දුවීම්/වාෂ්පීකරණය නිසාවෙන් සිදු වන අලාභ වෙනුවෙන් සලසන සහනදානයන් -

i දේශීය වශයෙන් බැඳුම්කර යටතේ හෝ ආනයනය අපනයනය සඳහා හෝ රජයේ කාර්යයන් සඳහා බදු රහිතව හෝ නිකුත් කැරුණ ස්ප්‍රීතු ප්‍රවාහනයේ දී කාන්දුවීමෙන් හෝ වාෂ්පීකරණයෙන් සිදු වන අලාභ වෙනුවෙන් ප්‍රවාහන අපතය වශයෙන් ඕනෑම කාල පරිච්ඡේදයක් සඳහා 0.05% ක උපරිමයක් දක්වා වන සහනදානයන් සලසනු ලැබේ. එම අපතය ආගණනය කිරීමේ දී නිකුත් කිරීම සිදු කළ දිනය, ප්‍රවාහනය සඳහා නිශ්චිතව මිඩංගු කැරුණ කාලය සහ නියමිත ස්ථානයට ලැබුණු දිනය සැලකිල්ලට ගනු ලැබේ.

ii බැඳුම්කර යටතේ හෝ බදු රහිතව හෝ ප්‍රවාහනය කරන ලද ස්ප්‍රීතු ප්‍රේෂණය එහි ගමනාන්තයේ දී ආමානය සහ සම්මත කළ නිලධාරියාගේ වාර්තාව අනුව යථෝක්ත ප්‍රමාණයට වඩා වැඩි අපතයක් සිදු වී ඇති බව පෙනී ගියහොත් එවිට එම ඌණතාවයේ සහනදානය ඉක්මවා සිටි ප්‍රමාණය වෙනුවෙන් තත් අවස්ථාවේ බල පවත්නා බදු අනුපාතිකය අනුව ස්කාගාරකරු/ගුදම් ක්‍රියාකරු/බෝතල්ගත කිරීමේ යන්ත්‍රාගාර ක්‍රියාකරු බදු ගෙවිය යුතු ය. එකී 0.05% සීමාව ඉක්මවා ගොස් ඇත්තේ නොවැළැක්විය හැකි හේතුවක් කරණ කොට ගෙන බව සුරාබදු කොමසාරිස් ජනරාල් හෝ ඔහු විසින් පත් කෙරුණ එවැනි නිලධාරියෙකු සෑහීමට පත්වන අයුරින් ඔප්පු කරනු ලැබුවහොත්, එවැනි ඌණතාවයක් මත ඉහත කී අනුපාතිකය මත බදු අයකිරීම අතහැර දැමීමට සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ නිර්දේශ මත භාණ්ඩාගාර ලේකම්ට හැකිය. මෙය අදාළ වන්නේ වෙනත් අයුරකින් හානි පූරණයක් සිදු නොවන අවස්ථාවක දී පමණි.

iii මෙම රීතිය යටතේ ඉඩදිය හැකි සහනදානය නිශ්චය කරනු ලැබිය යුත්තේ ස්කාගාරයේ /ගුදමේ / බෝතල්ගත කිරීමේ යන්ත්‍රාගාරයේ සිට යැවුන ස්ප්‍රීතු ප්‍රමාණයෙන් ගමනාන්තයේ දී භාරගත් ප්‍රමාණය අඩු කිරීමෙනි.''

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.